# 3 වන මාතර රාහුල විද්‍යාලයීය ආදී බාල දක්ෂ සංසදය

## ව්‍යවස්ථා මාලාව

**01.**

රාහුල විද්‍යාලීය බාලදක්ෂ සමූහය බාලදක්ෂයකු ලෙස කටයුතු කරන ලද දැනට රාහුල විද්‍යාලයට මෙන්ම බාලදක්ෂ සමූහයටද ඇලුම් කරන සහෘදයන්ගේ එකමුතුවකි.

**02.**

◈සොබාදහම් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම.

◈මාතර රාහුල විදුහලේ උන්නිතියලසුභ සාධනය සහ විදුහලේ සම්ප්‍රදායන් රැකීම සඳහා ප්‍රායෝගිකව ක්‍රියාත්මක වීම.

◈විද්‍යාලයේ ප්‍රගතිය සඳහා ගොඩනගා ඇති සහ ගොඩනගනු ලබන ඕනෑම සංවිධානයක් හෝ කණ්ඩායමක් සඳහා උපරිම සහයෝගයෙන් කටයුතු කිරීම.

◈ආදී බාලදක්ෂ සංසදයේ සාමාජිකත්වයේ පොදු සුභසාධනය සඳහා ක්‍රියාත්මක වීම.

◈සාමාජිකත්වය තම ජීවිතය අවදානම් අවස්ථාවට පත්ව ආර්ථික අසීරුතාවලට මුහුණපෑ අය වෙත්නම් හැකි පමණින් ආධාර කිරීම.

◈මොනයම් මංගලල අවමංගල අවස්ථාවන්හි දී සහභාගි වීම හා ආධාර කිරීම.

◈අඩු ආදායම් දෙමාපියන්ගේ දරුවන් බාලදක්ෂ සමූහයට සම්බන්ධ වීමේදී හැකි පමණින් මුල්‍යමය ශක්තියක් වීම.

◈අන්තර් ජාතික නියෝජනයකදී විද්‍යාලය නියෝජනය කරන බාලදක්ෂයකු හට මුල්‍යමය ශක්තියක් වීම.

**03.**

◈නියමිත අධ්‍යන කාලය අවසන් කර පාසැල හැරගිය 3වන මාතර බාලදක්‍ෂ සමූහයේ බාලදක්‍ෂයකු ලෙස කටයුතු කර තිබීම.

◈සාමාජික අයදුම් පතක් ඉදිරිපත් කිරීමෙන් සාමාජිකත්වය ලැබිය හැකිය.

◈සෑම සාමාජිකයකුටම සාමාජික මුදල් කණ්ඩායමට එවිය යුතුය.

◈සාමාජිකත්වය පිරිනැමීම අයදුම්පත ඉදිරිපත් කර මසක කාලයක් තුල ලිඛිතව දැනුම් දෙනු ලැබේ.

◈යම් සාමාජිකත්වයකට විරුද්ධත්වයක් වේ නම් කාරක සභාවේ අධීක්‍ෂණයට එය යොමුවන අතර සුදුසු / නුසුදුසු කම්වල අවසාන තීරණය දෙනු ඇත.

◈ඉහත සුදුසුකම් ලැබුවද විනය හේතු මත බාලදක්‍ෂ සමූහයෙන් හෝ රාහුල විද්‍යාලයෙන් ඉවත් කරන ලද අයකු අප සංසදයේ සාමාජිකත්වය සඳහා සුදුසු නොවන්නේය.

**04.**

**(I).කණ්ඩායම මුලිකව,**

**(i).කැඳවුම් කරුවන් දෙදෙනෙකු ද**

**(ii).සභාපති සහ උපසභාපති ද**

**(iii).ලේකම් හා උපලේකම් ද**

**(iv).භාණ්ඩාගාරික හා**

සත් දෙනෙකුගෙන් යුක්ත කාරක සභාවකින් ද වන අතරල ගිණුම් පරීක්‍ෂාව සඳහා සාමාජිකත්වය ඒකමතිකත්වයෙන් යුතුව තිදෙනෙකුගේ කමිටුවක් ක්‍රියාත්මක වනු ඇත.

(II).මේ සියලු තොරතුරු සාමාජිකත්වය ඒකමතිකත්යේ යෝජනා හා ස්ථිර කිරීම් වලට යටත්ව පවත්වන අතර එක් අයෙකුට වඩා යෝජනා ස්ථිර වූ විට පොදු ඡන්දයට යොමු කරනු ඇත.

(III).මේ සියලු තනතුරු වල නිල කාලය වසරකි:සැඑයු ඊ- මෙම කාලය කාරක සභාවේ අනුමැතිය මත දීර්ඝ හෝ කෙටි කිරීම සිදුවිය හැකි අතරල මහා සභා රැස්වීමක සාමාජාක ඡන්දයක් මත තනතුරුවල වලංගු කාලය තීරණය වෙයි.)

(IV).වසරකට වරක් නීත්‍යානුකූල මහා සභාව රැස්වීල ඉදිරි ක්‍රියාකාරීත්වය ගැන සාකච්ජා කරනු ඇතගකාරක සභාව වසරකට සිව් වතාවක් රැස්විය යුතුය.

(V).සාමාජිකත්වයේ කැඳවීම නීත්‍යානුකූල වන්නේ කැඳවුම්කරුවන්ගේ (දෙදෙනාම) අත්සනින් යුතු ලිපි හෝ පුවත්පත් දැන්වීම් වලින් පමණි.

(VI).මුල්‍ය කටයුතු පිළිබඳ වගකීම භාණ්ඩාගාරික වෙත පවරන අතරල වාර්ෂික අය වැයක් ඉදිරිපත් කල යුතුය.

(VII).සාමාජික මුදල් මහා සභාවේදී යෝජනා වී ස්ථිර විය යුතුය.

(VIII).කණ්ඩායමේ ගිණුම් රාජ්‍ය හා පෞද්ගලික බැංකු ආයතනවල පවත්වාගෙන යන අතරල ගණුදෙනු සඳහා භාණ්ඩාගාරිකලලේකම් සහ සභාපති ගේ අත්සනින් යුතුව කටයුතු කළ හැක.

(IX).සංසඳයේ අනුශාසක පදවිය නිතරගයෙන්ම විද්‍යාලයෙහි විදුහල්පති තුමා හට හිමි වනු ඇත.